2013/10/23

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

සමෘද්ධි සහකාර කොමසාරිස්/දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ

ප්‍රාදේශීය ලේකම්/ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ

දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී

## දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර සමෘද්ධි බැංකු සංගම් වල කුඩා කණ්ඩායම් හා ප්‍රජා මූල සංවිධාන පිළිබඳ දැනුවත් කිරීම

උක්ත මැයෙන් යොමු කල සමාංක දරණ 2013/10/07 දිනැති ලිපිය හා බැඳේ. එම ලිපිය මගින් දිස්ත්‍රික්කයේ සියලුම සමෘද්ධි කුඩා කණ්ඩායම් 2013/දෙසැම්බර්/15 වන විට දැනුවත් කරන ලෙස දන්වා ඇත.

සමෘද්ධි අධිකාරිය විසින් දිස්ත්‍රික්කයකින් තෝරා ගත් කළමණාකරුවන් දෙදෙනෙකු, මෙම විෂය පිළිබඳව 2013/10/22 දින දැනුවත් කරන ලදී. මෙම නිලධාරීන්ද, ක්ෂුද්‍ර මූල්‍යය කරණය පිළිබඳව පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහනට සහභාගී වූ මේ සමග නම් සඳහන් කර ඇති නිලධාරීන්ද සහභාගී කර ගෙන දිස්ත්‍රික්කයේ අදාල කළමණාකරුවන්, සංවර්ධන නිලධාරීන් මෙන්ම මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කල හැකි සෙසු නිලධාරීන් හා ප්‍රජා සංවිධාන නායකයින් කඩිනමින් දැනුවත් කිරීමේ දිස්ත්‍රික් වැඩසටහනක් සංවිධානය කල යුතුය.එමගින් තෝරා ගන්නා කණ්ඩායම් තුලින් සියලුම ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ සැලැස්මක් සකසා ගත යුතුය. මෙම සැලැස්ම පිළිබඳව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරු ද දැනුවත් කල යුතුවේ.

මෙම වැඩපිළිවෙල සඳහා ප්‍රතිපාදන ඔබ වෙත දැනටමත් යොමු කර ඇති අතර ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් මෙම දැනුවත් කිරීම සඳහා වන වැඩසටහන පිළිබඳව සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය මහ සංගම් අංශය දැනුවත් කල යුතුය.

අනුමත සීමා තුල සම්පත්දායක දීමනාවක් මෙම වැඩසටහන් සඳහා ලබා ගත හැක.(අනුමත සීමා :- අධ්‍යක්ෂ පැයට රු.400/= ,නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ පැයට රු.300/= සමෘද්ධි කළමණාකරු සහ සෙසු නිලධාරීන් සඳහා පැයට රු.250/= කි. දිනකට එක් නිලධාරියෙකු සඳහා උපරිම පැය 04ක් සඳහා ගෙවිය හැකිය.) එසේම ලිපි ද්‍රව්‍ය, ඉන්ධන සහ වෙනත් අදාල වියදම් සඳහා මෙම ප්‍රතිපාදන වැය කල හැක. ප්‍රතිපාදන සීමා තුල සුදුසු පරිදි මෙම දැනුවත් කිරීම සඳහා යන වියදම් ගලපා ගත යුතුය.එක් ග්‍රාම නිලධාරී වසමක් සඳහා සම්පත්දායක දීමනාව උපරිමය රු.1000 ක් විය යුතුය.එම වැඩසටහන සංවිධානය කිරීම අදාල වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් හෝ බැංකු සංගමයේ කලාප සහකාර විසින් සිදුකල යුතුය.

ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විශේෂිත අවස්ථාවකදී ඒ පිළිබඳව සමෘද්ධි අධිකාරිය දැනුවත් කර අවශ්‍ය අමතර ප්‍රතිපාදන හා අනුමැතිය ලබා ගත යුතුය. එසම් මට්ටමින් අදාල දැනුවත් කිරීමෙන් අනතුරුව මේ සමග ඇති ඇමුණුමේ පරිදි ප්‍රගතිය වාර්තා කල යුතුය.

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමට සිදුකල යුතු වැඩසටහන් හා රාජකාරී පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් මෙම වැඩසටහන ප්‍රමුඛ වැදගත් කාර්යයක් සේ සලකා දිස්ත්‍රික්කයේ සියලුම සමෘද්ධි කුඩා කණ්ඩායම් හා සමිති සාමාජිකයින් 2013 දෙසැම්බර් 31ට දිනට පෙර දැනුවත් කර සමස්ත දිස්ත්‍රික් ප්‍රගති වාර්ථාව ඒ සමගම අප වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

මේ පිළිබඳව තවදුරටත් අවශ්‍ය තොරතුරු වේ නම් සමෘද්ධි අධිකාරියේ මහ සංගම් හා බැංකු අංශයෙන් ලබා ගත හැකි අතර මෙම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමට ඔබ දක්වන සහාය අගය කරමි.

ආර්.පී.බී .තිලකසිරි,

අධ්‍යක්ෂ ජනරාල්.

සී.ඩී. කළුආරච්චි

අධ්‍යක්ෂ බැංකු මූලා (වැ.බ)

සාමාන්‍යාධිකාරී.

පිටපත් :- 01. ලේකම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස

02. අතිරේක ලේකම්, (ග්‍රාමීය ආර්ථික) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස

03. සමෘද්ධි අධිකාරියේ සියලුම අංශ ප්‍රධානීන් - කරු.දැ.ගැ.ස හා අ.ක.ස

04. නියෝජ්‍ය අභ්‍යන්තර විගණක, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය - කරු.දැ.ගැ.ස හා අ.ක.ස